

# ලංකා ජනගහණයෙන් ලක්ෂ 16ක් ආබාධිතයි

**මගේ දරු පැටියා ඉපදිලා, අතට ගත්ත මුල්ම වෙලාවේ මට දැනුණේ මගේ ලෝකෙට ඉරයි හඳයි එකපාර පැයුවා කියලයි. මගේ ලෝකෙම දරුවා එළිය කරාවි කියලා මම හිතුවා. ඒත් මගේ ලෝකේ විතරක් නෙවෙයි දූගේ ලෝකෙත් මහ තිත්ත කළුවරක අතරමං වේවි කියලා මම හීනෙකින්වත් හිතුවේ නැහැ. මගේ දරු පැටියාගේ ඇස් දෙක ලස්සනට තිබුණට ඒ ඇස්වලින් ලෝකය බලන්න බැරි ආබාධිත දරුවෙක් කියල දැනුණහම මගේ ලෝකේ කඩාගෙන වැටුණා. ආබාධිත දියණියකගේ මවක් එසේ හඬා වැලපෙද්දී එවැනිම තවත් කොතෙකුත් මව්වරුන් පියවරුන් ලෝකයට රහසින් මේ ආකාරයට කොතෙක් වැලපෙනවා ඇතිද...?**

එපමණක් නොව අනෙකුත් සාමාන්‍ය දරුවන් පියවරින් පියවර උස්මහත් වෙමින් අධ්‍යාපනය, ක්‍රීඩා, කලා අංශවලින් ඉදිරියට යද්දී, ආබාධිත දරුවෙකු තුරුලු කරගෙන හඬා වැටෙන තවත් මව්වරුන් පියවරුන් කොතෙකුත් ඇද්ද...?

ආබාධ සහිත පුද්ගලයා සහ ආබාධ නොවන සාමාන්‍ය පුරවැසියා ද සම අයිතිවාසිකම් සහ වරප්‍රසාද සහිතව සමාජය තුළ ජීවත් විය යුතු බවත්, ආබාධ සහිත පුද්ගලයන්ගේ නිර්මාණ හැකියාවන් සහ කුසලතාවන් වැඩි දියුණු කිරීමට පසුබිම සලසා දීම රජයේ වගකීම බවත් බොහෝ ආණ්ඩු සහ බොහෝ පාලකයන් පැවසුව ද එය එසේ වී දැයි යන්න ගැටලුවකි.

ආබාධිත භාවය මේ වෙන විට ජාතික ගැටලුවක්ව පවතී. 1996 අංක 28 දරන නීතිය ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීත්‍යනුකූලව පිළිගත් පනත වෙයි. තමන්ගේ වැඩ කටයුතු තමන්ටම කරගත නොහැකි මානසිකව හා ශාරීරික වශයෙන් ...මකිසි දුර්වලතාවක් සහ බිඳවැටීමක් ඇති ...යෙකු ආබාධිතයෙකු වශයෙන් පිළිගැනේ.

**ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර ...රිසරයක් උදාකර දීම උදෙසා ඔවුන්ගේ ...යිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ ...බ සාධනය ඇතුළු සහන සැලසීම ආබාධ ...හිත තැනැත්තන් සඳහා වූ ජාතික ...හලේකම් කාර්යාලයේ කාර්යභාරය වෙයි.**



බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ චන්දිමා දිසානායක



ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂිකා ඉශංකා හේරත්

වෙමින් යනවා. මෙහෙන් අරමුදලක් යන්නේ නැහැ. නමුත් කුමක් හෝ හදිසියෙන් සංවර්ධන අවශ්‍යතාවක් වැනි දෙයක් වුණොත් රුපියල් ලක්ෂ 2ක් පමණ ආධාරයක් රජයෙන් ලැබෙනවා.

සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පාලනය වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තියෙනවා නේ. සමාජ සේවා නිලධාරියා සහ ස්ව ශක්ති කණ්ඩායම් සමග මේ පිළිබඳව සොයා බැලීම් කරනවා. ආබාධිත දරුවෙක් සිටිනවා නම්, සමාජ සේවා නිලධාරියට යම් බලයක් තියෙනවා මේ ගැන සොයා බලන්න. අපේ මේ පිළිබඳව ලින්ක් එකක් තියෙනවා. මේ ගැන සොයා බලනවා වගේම මේ හරහා වෘත්තීය පුහුණුවකට විශ්වවිද්‍යාලයට සහ වෘත්තීය පුහුණු ආයතනයකට යොමු කරනවා. සමාජ සේවා නිලධාරින් හරහා යොමු කරනවා. එතැනදී ඒ ඒ අංශවලට යොමු කර, තමන්ගේ කැමැත්ත පරිදි විධිමත් පුහුණුවක් දෙනවා.

ඉදිරියේ දී අපි 2021 දීත් සංගණනයක් කරනවා. ඊට අමතරව මේ වර්ෂයේ අපි සැලසුම් කරගෙන යනවා ග්‍රාමසේවා වසම් මට්ටමින් ආබාධිත පුද්ගලයන් කොපමණ සිටිනවාද, තොරතුරු ඒකරාශි කරගන්න ආබාධිත වුවන් සඳහා වූ මහලේකම් කාර්යාලයෙන් කරනවා. නිශ්චිතවම කොපමණ සිටිනවා ද යන තොරතුරු ලබා ගැනීම අසීරු වෙන්නේ බොහෝ දෙමාපියන් තම දරුවා පිළිබඳ තොරතුරු ...

තැනකින් සියල්ල කරන්න බැහැ. ආබාධිත මහලේකම් කාර්යාලයෙන් ගොඩක්දුරට ක්‍රියාත්මක වෙන්නේ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක වීම තමයි. රෝද පුටු අවශ්‍යතා, වෛද්‍යාධාර, ස්වයං රැකියා, මේ ආධාර ලබා ගන්න පුළුවන්. එහෙම අවස්ථාවක් තියෙනවා නම් ළඟම තියෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියා හමුවීමෙන් ඒ කටයුතු කරගැනීමට හැකියාව තිබෙනවා.

**මේ අතර මෙම ආබාධිත ප්‍රජාව සම්බන්ධයෙන් අප වැඩිදුරටත් කළ සොයා බැලීමේ දී බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ චන්දිමා දිසානායක මහත්මිය බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වැඩපිළිවෙළ පැහැදිලි කරමින් එම දරුවන් වෙනුවෙන් ඇතිකර ඇති විශේෂ මධ්‍යස්ථාන ගැන ද පැහැදිලි කිරීමක් කළාය.**

"විශේෂ අවශ්‍යතා තියෙන දරුවන්ව මූලික වශයෙන් ගතහොත් ඔවුන්ට පුනරුත්ථාපනය සහ මාර්ගෝපදේශනය කළ යුතුව තිබෙනවනේ. ඒ සඳහා තියෙනවා. රජයෙන් ක්‍රියාත්මක වෙන ආයතනයක් සත්සෙවන ආබාධිත මධ්‍යස්ථානයක්. එය පිරිමි දරුවන් වෙනුවෙන් ස්ථාපිත විශේෂ නිවාසයක් වෙන අතර මීරිගම පිහිටා තිබෙනවා. දැනට නේවාසික පහසුකම් දීමට හැකියාව තියෙන්නේ දරුවන් 30 දෙනෙකුටයි. ඊට අමතරව 10 දෙනෙක් විතර ඇවිල්ලා වෘත්තීය පුහුණුව සහ තමන්ගේ එදිනෙද ජීවිතයේ කාර්යයන් කරගන්න බැහැනේ මේ සමහර දරුවන්ට. ඒ පුහුණුවීම් කරනවා. ඊළඟට බෙල්ලන්තර ප්‍රදේශයේ මිත් සෙවණ කියලා නිවාසයක් තියෙනවා එය ආබාධිත ගැහැනු දරුවන් වෙනුවෙන් විශේෂිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයක්. එතැනදිත් ඒ දරුවන්ට මැහුම් ගෙතුම් අත්කම් වැනි දේ ගැන පුහුණුවක් දෙනවා. අදින්නේ කොහොමද කෑම බීම කන්නේ කොහොමද එවැනි සාමාන්‍ය වැඩ කටයුතු සියල්ල කියා දෙනවා. එතැන දරුවෝ 70 ක් ඉන්නවා. ඊළඟට තියෙනවා මයුර මාර්ගෝපදේශන මධ්‍යස්ථානය. එය තියෙන්නේ මතුගම. උදේට ඇවිල්ලා හවසට දරුවාව අරගෙන යන්න පුළුවන්. කථන චිකිත්සාව, වෘත්තිය ...

